**හෝමියෝපති වෛද්‍ය සභාව - 2021**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මතය**

-------

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

වෛද්‍ය සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වෛද්‍ය සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වෛද්‍ය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වෛද්‍ය සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වෛද්‍ය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වෛද්‍ය සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

--------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් වෛද්‍ය සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ වෛද්‍ය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ වෛද්‍ය සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, වෛද්‍ය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව

**1.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|

(අ) 1983 අංක 12 දරන නිලධාරියෙකුගේ සේවය අවසන් පාරිතෝෂිතය කඩිනමින් පාරිතෝෂිත පාරිතෝෂිත ගෙවීම් කිරීමේ දින සිට දින 30 ක් ඇතුළත ගෙවීම සඳහා නව ගෙවීම් පනතේ

| | | | |
|---|---|---|---|
| පනතේ 5(1) ඡේදය | පාරිතෝෂිකය ගෙවිය යුතු වුවද, 2021 ජුලි 15 දින සේවයෙන් ඉවත්ව තිබුණු වෛද්‍ය නිලධාරියෙකු වෙත පාරිතෝෂිත ගෙවා නොතිබුණු අතර 2021 නොවැම්බර් 09 දින සේවයෙන් ඉවත්ව තිබුණු ලේඛකාධිකාරී වෙත නියමිත කාලසීමාව තුළ පාරිතෝෂික නොගෙවීම හේතුවෙන් රු.52,140 ක අධිභාරයක් ගෙවීමට සිදුවන බව නිරීක්ෂණය විය. | ලේඛකාධිකාරිවරියට උපදෙස්දී ඇති බව හා 2022 නොවැම්බර් 09 දින සේවයෙන් ඉවත් වූ ලේඛකාධිකාරීට ගෙවිය යුතු පාරිතෝෂික මුදල් ලබා ගන්නා මෙන් දැනුම් දුන් නමුත් එය ලබාගැනීම ප්‍රතික්ෂේප කර ඇති බව. | විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) 2016 අංක 10 දරන හෝමියෝපති පනත<br>--------------------- | | | |
| (i) 15 වගන්තියේ (ඈ) හා (ඉ) උප වගන්ති | හෝමියෝපති වෛද්‍ය සභාව විසින් හෝමියෝපති ආයතනයක් පිහිටුවා නොතිබුණු අතර රජයේ හොමියෝපති ශික්ෂණ රෝහල හැර හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට ප්‍රතිකාර ලබාදෙන හෝමියෝපති ආයතන නියාමනය කිරීම සඳහා අවම ප්‍රමිතීන්, රීති හා රෙගුලාසි පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණු හෙයින් එම ආයතන නියාමනය කිරීමේ කාර්යය ඉටුවී නොතිබුණි. | හෝමියෝපති ආයතනයක් පිහිටුවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෛද්‍ය සභාව සතුව නොමැති බව, සභාව වෙත වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම්ද මෙම වර්ෂය සඳහා ලබා නොදුන් බැවින් රටේ ආර්ථික තත්ත්වය සමතයකට පත් වන තෙක් ආයතනය පිහිටුවීම තාවකාලිකව කල්දමා ඇති බව හා<br>නියාමනය සඳහා අවම ප්‍රමිතින් තීරණය කිරීම රෙගුලාසි සකස් කිරීම මේ වන විට සිදු කරමින් පවතින බව. | හෝමියෝපති පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 28 (6) උප වගන්තිය | හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීම සඳහා වෛද්‍ය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනය, ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු ගෙවූ වෛද්‍යවරුන් හා නොගෙවූ වෛද්‍යවරුන් වෙන් වෙන්ව හඳුනා ගැනීමට හා හිඟහිටි ගාස්තු හඳුනා ගැනීමට හැකි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | ලියාපදිංචි කිරීමේ හා ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු සඳහා ලේඛන වෙන වෙනම පවත්වා ගැනීම සඳහා නිලධාරීන්ට උපදෙස් ලබාදී තිබුණු බව, අද වන විට ලේඛන වෙන වෙනම පවත්වාගෙන යන බව හා අතපසුවීම හේතුවෙන් විගණනය කළ අවස්ථාවේදී එම ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත්වී ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (iii) 30 වගන්තිය | හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා පැවැත්විය යුතු විභාගය සඳහා වූ නීති හා රෙගුලාසි සම්පාදනය කිරීම අවසන්කර නොතිබියදී 2018 වර්ෂයේදී විභාගය සඳහා අයදුම්පත් කැඳවා තිබුණි. මේ හේතුවෙන් විභාගය, 2022 ඔක්තෝබර් 31 දින වනවිටත් පැවැත්වීමට නොහැකිවී තිබූ අතර වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමද ප්‍රමාදවී තිබුණි. | හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා රෙගුලාසි 2022 ජුනි 10 දින ගැසට් කළ බව, විභාග කමිටුව පිහිටුවීම අවසන් කර ඇති බව, ප්‍රශ්නපත්‍ර සැකසීම සිදු වෙමින් පවතින බව හා විභාගය ජනවාරි මස දෙවන සතියේ පැවැත්වීමට කටයුතු කරන බව. | -එම- |
| (iv) 31 උප වගන්තිය | හෝමියෝපති ඖෂධවේදීන් ලියාපදිංචි කිරීම සඳහා හෝමියෝපති ඖෂධවේදී ලේඛනයක් පවත්වාගත යුතු වුවද, 2022 ඔක්තෝබර් 31 දින වන විටත් එම ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | හෝමියෝපති රෙගුලාසි මේ වන විට සකස් වෙමින් පවතින අතර ගැසට් කිරීම අවසන් වූ විගස ඖෂධවේදීන් ලියාපදිංචි කිරීම සිදු කළ හැකි බව. | -එම- |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>--------------------- | | | |
| (i) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 16.1 වගන්තිය | සේවයෙහි ස්ථිරකිරීම, උසස් කිරීම හා කාර්යක්ෂමතා කඩඉම්වලින් උසස් කිරීම ආදී විභාග නියමිත දිනවල පැවැත්වීමට ආයතන ප්‍රධානී වගබලා ගතයුතු වුවද, 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා බඳවාගෙන තිබුණු තනතුරු 04 කට අදාළව නිලධාරීන් 32 දෙනෙකු වෙනුවෙන් විගණිත දිනය වූ 2022 ඔක්තෝබර් 31 දින වන විටත් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම නිලධාරීන් සේවයෙහි ස්ථිර කළ නොහැකිව තිබුණු අතර ඔවුන්ගේ පරිවාස කාලය දීර්ඝ කිරීමටද කටයුතු කර නොතිබුණි. | කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත වෛද්‍ය සභාව විසින් බලය පවරා ඇති බව, ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් මෙය කඩිනමින් සිදු කරන බව දන්වා ඇති බව හා එතෙක් නිලධාරීන්ගේ පරිවාස කාලය දීර්ඝ කිරීමට වෛද්‍ය සභාව ඉදිරියේදී කටයුතු කරන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.3 වගන්තිය | සාමාන්‍යයෙන් නිවාඩු ඉල්ලුම් පත්‍රයක් නිවාඩුව ආරම්භ වන දිනට යටත් පිරිසෙයින් දින හතකටවත් කලින් නිවාඩු අනුමත කරන බලධරයාගේ කාර්යාලයට ලැබිය යුතු වුවද, වෛද්‍ය සභා කාර්යාලයේ නිලධාරීන් නිවාඩු ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර අනුමත කරවාගෙන නොතිබුණි. | නිවාඩු ලබා ගැනීම සඳහා අවම දින 7 කටවත් කලින් නිවාඩු අනුමත කරන නිලධාරියා වෙත ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ලෙස සියළුම නිලධාරීන්ට තරයේ දැනුම් දී ඇති බව හා මේ සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා ලේඛකාධිකාරී වෙත උපදෙස් ලබා දී ඇති බව. | -එම- |
| (iii) ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය | 190 වැනි පොදු ආකෘතිය ප්‍රකාරව නිවාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | පැවති කොවිඩ් තත්ත්වය නිසා නිවාඩු ලේඛනය නියමිත ආකාරයට යාවත්කාලීන කිරීමට නොහැකිව ඇති බව හා නිවැරදිව යාවත්කාලීන කිරීම සඳහා ලේඛකාධිකාරී වෙත උපදෙස් ලබාදී ඇති බව. | -එම- |
| (v) ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 3.1 වගන්තිය | අවසර ලබා නොගෙන ස්වකීය කාර්ය ස්ථානයෙන් පිට යාමට නිලධාරියකුට නොහැකි වුවද, වෛද්‍ය සභාවේ නිලධාරීන් අනුමැතියකින් තොරව පිටවී තිබුණු අතර බැහැරයාමේ ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි. | මේ වන විට නියමිත ආකාරයෙන් බැහැර යාමේ ලේඛනය විධිමත්ව පවත්වාගෙන යන බව. | -එම- |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------- | | | |
| (i) මුදල් රෙගුලාසි 133 | සභාව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් පැවැත්වීම සඳහා නුදුරේදීම අමාත්‍යාංශය සමඟ සම්බන්ධව කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 751 | ආයතනයට ලැබෙන සියළුම භාණ්ඩ වහාම බඩු ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතු වුවද, 2020 වර්ෂයේදී මිලදීගත් රු.255,140 ක්වූ භාණ්ඩ පොදු ද්‍රව්‍ය හා ශල්‍ය ද්‍රව්‍ය ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. | පැවති කොවිඩ් තත්ත්වය හේතුවෙන් කාර්යාලයේ වැඩකටයුතු නියමිත වේලාවට සිදු කිරීමට නොහැකි වූ බව හා මේ වන විට ලේඛන නියමිත ආකාරයට පවත්වාගෙන යාම සඳහා ලේඛකාධිකාරී වෙත උපදෙස් ලබාදී ඇති බව. | -එම- |
| (ඉ) | 2018 නොවැම්බර් 14 දිනැති අංක 2/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමක මුදල් තැන්පත් කළ යුතු වුවද, 2009 වර්ෂයේදී අයකර තිබුණු රු.1,204,500 ක්වූ පාඨමාලා ගාස්තු පෞද්ගලික බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත්කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.2,022,267 ක් විය. | මෙම මුදල පෞද්ගලික බැංකුවෙන් ඉවත් කර රජයේ බැංකුවක ස්ථිර තැන්පතුවක් ලෙස තැන්පත් කිරීමට වෛද්‍ය සභාව තීරණය කර ඇති බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය. | මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත අනුමත මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතු වුවද, 2021 මූල්‍ය වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ගිණුම් මාස 07 කට වඩා වැඩි කාල ප්‍රමාදයක් සහිතව 2022 ඔක්තෝබර් 04 දින ඉදිරිපත් කර තිබුණි. | සභාවේ ගණකාධිකාරිවරයෙකු නොමැති බව, රටේ පැවති කොවිඩ් තත්ත්වය හේතුවෙන් ගිණුම් කටයුතු සිදු කළ බාහිර ගණකාධිකාරිවරයා විසින් ලිපිගොනු ලබාදීම ප්‍රමාද වූ බව. | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.312,581ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාව රු. 1,719,379 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,406,798 ක වර්ධනයක් නිරීක්ෂණය විය. රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන රු.1,946,404 කින් වැඩිවීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

----------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මහජන මුදල් රැස්කිරීම සඳහා බලයක් ලැබෙන කිසිදු ප්‍රතිපාදනයක් නොමැතිව හා විධිමත් අනුමැතියකින් තොරව “හෝමියෝපති අරමුදල” නමින්, එකක් රු.5,000 ක වටිනාකමක් සහිත ආධාර පත්‍ර පොත් මුද්‍රණයකර තිබුණි. මුද්‍රණය | මෙම ආධාර පත්‍ර විනාශ කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති බව හා නුදුරේදීම ඒවා අපහරණය කර ඉවත් කරන බව. | මෙම ආධාර පත්‍ර පොත් තොගය අපහරණය කර ඉවත් කිරීම කඩිනමින් කළ යුතුය. |

කළ වර්ෂය, මුද්‍රණය කළ මුළු ආධාර පත්‍ර සංඛ්‍යාව, ආධාර පත්‍ර අලෙවි ආදායම හා එම මුදල් බැංකුගත කිරීම පිළිබඳ තොරතුරු කිසිවක් සභාව සතුව නොතිබුණි. පැවති පහළම පොත් අංකය හා ඉහළම පොත් අංකය අතර පොත් 159 ක හිඟයක් පැවති අතර එමගින් රැස්කළ හැකිව තිබුණු මුළු මුදල රු.795,000 ක් විය. ඉන් පොත් 416 ක තොගයක් ඉතිරිව පැවතුණු අතර 2022 ඔක්තෝබර් 31 දින වනවිටත් එම ආධාර පත්‍ර පොත් අවලංගු කිරීමට හෝ අපහරණය කර ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ විධිවිධානවලට අනුව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ඒ සඳහා රු.1,199,254ක ලී බඩු හා වෙනත් අවශ්‍ය උපකරණ සපයාගෙන තිබුණි. එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2022 ඔක්තෝබර් 31 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව මිලදීගෙන තිබුණු ස්ථාවර වත්කම් වර්ෂ 13 කට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුන අතර ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයෙන් බැහැරව හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්යාලය පවත්වාගෙනයාම සඳහා භාවිතා කර තිබුණි. | වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා ශික්ෂණ රෝහලක්, එක් එක් විෂයයන් සඳහා අධ්‍යනාංශ සුදුසුකම්ලත් ආචාර්ය මහාචාර්ය ආදී බොහෝ සම්පත් අවශ්‍ය වන බව, මේ වන විට ශ්‍රී ලංකාවේ මෙම සම්පත් කිසිවක් නොමැති බැවින් ඉදිකර ඇති කාමර 04 ක් සහිත ගොඩනැගිල්ල විනාශවීම වළක්වා ගැනීම සඳහා අමාත්‍යාංශයේ ලේකම්ගේ වාචික උපදෙස් මත සංවර්ධනය කර වෛද්‍ය සභා කාර්යාලය ලෙස තාවකාලිකව භාවිතා කරන බව. | ඉදිකර ඇති ගොඩනැගිල්ල හා මිලදී ගෙන ඇති උපකරණ අදාළ අරමුණ වෙනුවෙන් යොදවා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |